(අටවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 51.]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2016 පෙබරවාරි මස 12 වැනි සිකුරාදා අ. භා. 1.30 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **කරු ජයසූරිය මහතා,** කථානායකතුමා

ගරු **තිලංග සුමතිපාල මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභාපතිතුමා

ගරු **සෙල්වම් අඩෛක්කලනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභාපතිතුමා

---

ගරු **රනිල් වික්‍රමසිංහ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා

ගරු **වජිර අබේවර්ධන මහතා,** ස්වදේශ කටයුතු අමාත්‍යතුමා

ගරු **ජෝන් අමරතුංග මහතා,** සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **ගයන්ත කරුණාතිලක මහතා,** පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **අකිල විරාජ් කාරියවසම් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ලක්ෂ්මන් කිරිඇල්ල මහතා,** උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **මනෝ ගනේසන් මහතා,** ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා

ගරු **එස්. බී. දිසානායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යතුමා

ගරු **එස්. බී. නාවින්න මහතා,** අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා

ගරු **ඒ. ඩී. සුසිල් ප්‍රේමජයන්ත මහතා,** විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යතුමා

ගරු **විජිත් විජයමුණි සොයිසා මහතා,** වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යතුමා

ගරු **රවුෆ් හකීම් මහතා,** නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **අබ්දුල් හලීම් මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** නගර සැලසුම් හා ජල සම්පාදන රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **විජයකලා මහේස්වරන් මහත්මිය,** ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **රුවන් විජයවර්ධන මහතා,** ආරක්ෂක රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රවීන්ද්‍ර සමරවීර මහතා,** කම්කරු හා වෘත්තීය සමිති සබඳතා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අශෝක් අබේසිංහ මහතා,** ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** මහානගර හා බස්නාහිර සංවර්ධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ෆයිසාල් කාසිම් මහතා,** සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** මහවැලි සංවර්ධන හා පරිසර නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,** විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **සුසන්ත පුංචිනිලමේ මහතා,** රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික බණ්ඩාරනායක මහතා,** නිවාස හා ඉදිකිරීම් නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **රන්ජන් රාමනායක මහතා,** සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **නිමල් ලාන්සා මහතා,** ස්වදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩුලිප් විජේසේකර මහතා,** තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු **අ. අරවින්ද් කුමාර් මහතා**

ගරු **ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා**

ගරු **නාලක ප්‍රසාද් කොලොන්නෙ මහතා**

ගරු **චන්ද්‍රසිරි ගජදීර මහතා**

ගරු **චන්දිම ගමගේ මහතා**

ගරු **උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා**

ගරු **නිහාල් ගලප්පත්ති මහතා**

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා**

ගරු **බන්දුල ගුණවර්ධන මහතා**

ගරු **(වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා**

ගරු **ක. තුරෙයිරෙත්නසිංහම් මහතා**

ගරු **පාලිත කුමාර තෙවරප්පෙරුම මහතා**

ගරු **විමලවීර දිසානායක මහතා**

ගරු වීරකුමාර දිසානායක මහතා

ගරු සාලින්ද දිසානායක මහතා

ගරු ඩග්ලස් දේවානන්ද මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු කේ. කේ. පියදාස මහතා

ගරු සනත් නිශාන්ත පෙරේරා මහතා

ගරු සුජිත් සංජය පෙරේරා මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු හිරුණිකා ප්‍රේමචන්ද්‍ර මහත්මිය

ගරු තාරක බාලසූරිය මහතා

ගරු මුහම්මදු ඉබ්රාහිම් මුහම්මදු මන්සූර් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා

ගරු (මහාචාර්ය) ආශු මාරසිංහ මහතා

ගරු බිමල් රත්නායක මහතා

ගරු ප්‍රසන්න රණවීර මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු විදුර වික්‍රමනායක මහතා

ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා

ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු සන්දිත් සමරසිංහ මහතා

ගරු එම්. එච්. එම්. සල්මාන් මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා

ගරු අලී සාහිර් මවුලානා සෙය්යිඩ් මහතා

ගරු චතුර සංදීප සේනාරත්න මහතා

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා

ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සරත් චන්ද්‍රලාල් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

නීල් ඉද්දවල මහතා, නියෝජ්‍ය මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, සහකාර මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල්තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකතුමා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2011 වර්ෂය සඳහා ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තැබිය යුතුයැයි නියෝග කරන ලදී.

(2) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්,

(i) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 නොවැම්බර් 20 දිනැති අංක 1941/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(ii) 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 ජනවාරි 12 දිනැති අංක 1949/29 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය;

(iii) 2011 අංක 17 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතින් අවසන් වරට සංශෝධිත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3ඇ වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 නොවැම්බර් 20 දිනැති අංක 1941/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ මත්පැන්වල සැර ප්‍රමාණය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 දෙසැම්බර් 15 දිනැති අංක 1945/8 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;
(අංක 982 දරන සුරාබදු නිවේදනය)

(v) කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ වාර්ෂික බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 දෙසැම්බර් 15 දිනැති අංක 1945/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;
(අංක 983 සහ 984 දරන සුරාබදු නිවේදන)

(vi) (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 25 වගන්තිය යටතේ හෝටල් තුළ මධ්‍යසාර භාවිතයට අදාළ ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 දෙසැම්බර් 31 දිනැති අංක 1947/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;
(අංක 986 දරන සුරාබදු නිවේදනය)

(vii) (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතෙහි 4 සහ 13 වගන්ති යටතේ විදේශ මත්පැන් අලෙවිය හා ප්‍රවාහනය සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 දෙසැම්බර් 31 දිනැති අංක 1947/41 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(අංක 985 දරන සුරාබදු නිවේදනය)

(viii) කලින් කලට සංශෝධන කරන ලද පරිදි (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තියේ (1) උප වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 දෙසැම්බර් 31 දිනැති අංක 1947/43 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(අංක 987 දරන සුරාබදු නිවේදනය)

(ix) කලින් කලට සංශෝධන කරන ලද පරිදි (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තියේ (1) උප වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 නොවැම්බර් 20 දිනැති අංක 1941/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(අංක 978, 979 සහ 980 දරන සුරාබදු නිවේදන)

(x) කලින් කලට සංශෝධන කරන ලද පරිදි (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තියේ (1) උප වගන්තිය යටතේ සුරාබදු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 දෙසැම්බර් 04 දිනැති අංක 1943/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(අංක 981 දරන සුරාබදු නිවේදනය)

(xi) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2016 ජනවාරි 01 දිනැති අංක 1947/45 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය; සහ

(xii) 2004 අංක 11 දරන මුදල් පනතේ 22 වගන්තිය සමඟ කියවිය යුතු 26 වගන්තිය යටතේ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද සම්බන්ධයෙන් මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව 2015 දෙසැම්බර් 14 දිනැති අංක 1945/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝගය

පිළිගන්වන ලදී.

එම ලිපිලේඛනාදිය **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

(3) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යතුමා විසින්, 2013 වර්ෂය සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව පිළිගන්වන ලදී.

එම වාර්තාව **සභා මේසය** මත තිබිය යුතුයැයි නියෝග කරන ලදී.

**2. පෙත්සම් :**

(1) (i) බණ්ඩාරගම, වැල්මිල්ලහන්දිය, කිඳෙල්පිටිය, කැස්බෑව පාර, අංක 108/1 දරන ස්ථානයෙහි පදිංචි ගුණපාල විජේසූරිය මහතාගෙන් ලැබුණු 2015.12.25 දිනැති පෙත්සම;

(ii) පාදුක්ක, වටරැක, ආටිගල පාර, පානලුවවත්ත, සමගි මාවත, අංක 80/29/1 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. එස්. ඩී. පෙරේරා මහතාගෙන් ලැබුණු 2015.10.01 දිනැති පෙත්සම;

(iii) පන්නිපිටිය, කොට්ටාව, පින්හේන, සිරිමල් පෙදෙස, අංක 39/10 දරන ස්ථානයෙහි පදිංචි පී. ඒ. ජිනදාස මහතාගෙන් ලැබුණු 2015.10.12 දිනැති පෙත්සම;

(iv) කෙන්ගල්ල, මල්පාන, "ශ්‍රීපාලි", අංක 12/D දරන ස්ථානයෙහි පදිංචි ආර්. ජී. පී. කමලදේව මහතාගෙන් ලැබුණු 2015.08.24 දිනැති පෙත්සම; සහ

(v) මහරගම, නාවින්න, ඉසිපතන පාර, අංක 78/1, දරන ස්ථානයෙහි පදිංචි සුවිනිතා මල්ලිකා පෙරේරා මහත්මියගෙන් ලැබුණු 2015.10.16 දිනැති පෙත්සම

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) දෙවිනුවර, කිරලවැල්ල පාර, අංක 69 දරන ස්ථානයෙහි පදිංචි බී. පී. ප්‍රගති තර්ෂණ මහතාගෙන් ලැබුණු 2016.01.12 දිනැති පෙත්සම;

(ii) මාතර, ඉසදීන් නගරය, මීරා පාර, අංක 102 දරන ස්ථානයෙහි පදිංචි චන්ද්‍රපාල වීරකෝන් මහතාගෙන් ලැබුණු 2016.01.21 දිනැති පෙත්සම;

(iii) සුල්තානාගොඩ, කපුහේන, අකුරුගොඩ, සරසවි කලායතනය යන ලිපිනයෙහි සේවය කරන එච්. එම්. ජයවර්ධන මහතාගෙන් ලැබුණු 2016.01.21 දිනැති පෙත්සම;

(iv) මාතර, වල්ගම, සමගි මාවත, අංක 69/5 දරන ස්ථානයෙහි පදිංචි එච්. ටී. මෙන්ඩිස් මහතාගෙන් ලැබුණු 2016.01.14 දිනැති පෙත්සම;

(v) මාතර, වේරගම්පිට, ශ්‍රී ධර්මවංශ මාවත, අංක 143/B දරන ස්ථානයෙහි පදිංචි හේමලතා රාජපක්ෂ මහත්මියගෙන් ලැබුණු 2016.01.20 දිනැති පෙත්සම;

(vi) මාතර, ඉසදීන් නගරය, යෙහියා පාර, අංක 71 දරන ස්ථානයෙහි පදිංචි කේ. ජී. මල්ලිකා මහත්මියගෙන් ලැබුණු 2016.01.12 දිනැති පෙත්සම;

(vii) ගාල්ල, වළහන්දූව, කබරයන්මුල්ල, ප්‍රියංකර උයන යන ලිපිනයෙහි පදිංචි කේ. පී. ආරියදාස මහතාගෙන් ලැබුණු 2016.01.21 දිනැති පෙත්සම;

(viii) ගාල්ල, මාගාල්ල, සර්කියුලර් පාර, අංක 266/1 දරන ස්ථානයෙහි පදිංචි ලීලා හෙට්ටිආරච්චි මහත්මියගෙන් ලැබුණු 2016.01.20 දිනැති පෙත්සම;

(ix) අකුරැස්ස, විල්පිට, මැදවත්ත යන ලිපිනයෙහි පදිංචි පී. ආර්. ඥානසිරි මහතාගෙන් ලැබුණු 2016.01.13 දිනැති පෙත්සම;

(x) ත්‍රිකුණාමලය, මහමයාපුර, අංක 70/1 දරන ස්ථානයෙහි පදිංචි එස්. එච්. රදිකා වාමෙන් මහත්මියගෙන් ලැබුණු 2016.01.12 දිනැති පෙත්සම; සහ

(xi) බත්තරමුල්ල, පැලවත්ත, දියවන්නා උද්‍යාන මාවත, අංක 51 R දරන ස්ථානයෙහි පදිංචි වී. ඒ. එදිරිමාන්න මහතාගෙන් ලැබුණු 2016.01.25 දිනැති පෙත්සම

ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

අංක 25අ දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**3. පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 1) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— අද දින ආණ්ඩුවේ කටයුතු මුඛ්‍යස්ථානය ගත යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**4. පාර්ලිමේන්තුවේ කටයුතු (අංක 2) :** පාර්ලිමේන්තුවේ සභානායකතුමා ඉදිරිපත් කළ යෝජනාව,— න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල අංක 2, 3, 4 සහ 5 දරන විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී අංක 20(7) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. ධීවර හා ජලජ සම්පත් (සංශෝධන) පනත් කෙටුම්පත** : දෙවැනි වර කියවීමේ නියෝගය කියවන ලදී.

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය"යි ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවැනි වර කියවන ලදී.

"පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය"යි ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

තදනන්තරව පාර්ලිමේන්තුව සම්මුති මාර්ගයෙන් කාරක සභාවකට පරිවර්තනය විය.

(කාරක සභාවේදී)

කථානායකතුමා මූලාසනාරූඪ විය.

1 වැනි වගන්තිය සභා සම්මත විය.

2 වැනි වගන්තිය

ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළ සංශෝධනයක් : 2 වැනි පිටුවේ 19 වන පේළියේ සිට 21 පේළිය දක්වා ඇති පේළි (ඒ පේළි දෙක ද ඇතුලත් ව) ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමට,—

| | |
|---|---|
| මීටර් 24.0 ට වඩා වැඩි සහ මීටර් 45.0 ට වඩා අඩු | රුපියල් මිලියන 25 |
| මීටර් 45.0 ට වඩා වැඩි සහ මීටර් 75.0 ට වඩා අඩු | රුපියල් මිලියන 50 |
| මීටර් 75.0 ට වඩා වැඩි | රුපියල් මිලියන 100 |

"සංශෝධනය පිළිගත යුතුය" යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

"වගන්තිය සංශෝධිතාකාරයෙන්, පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය", යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

3 වැනි වගන්තියේ සිට 5 වැනි වගන්තිය දක්වා සභා සම්මත විය.

**ප්‍රඥප්ති වගන්තිය හා නාමය**

“ප්‍රඥප්ති වගන්තිය හා නාමය පනත් කෙටුම්පතේ කොටසක් වශයෙන් තිබිය යුතුය” යන ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත සංශෝධන සහිතව වාර්තා කරන ලදී.

පනත් කෙටුම්පත දැන් සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවිය යුතුය යැයි ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

පනත් කෙටුම්පත,ඊට අනුකූලව, සංශෝධිතාකාරයෙන් තුන්වැනි වර කියවා සම්මත කරන ලදී.

(අ. භා. 2.25 ට නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.)

**6. උතුරු නැගෙනහිර අතුරුදහන් වූ දෙමළ ජනතාවට මරණ සහතික ලබා දීම :** ගරු බුද්ධික පතිරණ මහතා, ගරු වජිර අබේවර්ධන මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— උතුරු නැගෙනහිර ප්‍රදේශවල යුද්ධය පැවති පසුගිය දශක තුනක පමණ කාලය තුළ විවිධ හේතූන් නිසා අතුරුදහන් වී ඇති පුද්ගලයන් මේ වනවිට ජීවතුන් අතර සිටී ද නැද්ද යන්න කඩිනමින් පරීක්ෂණ පවත්වා ඔවුන් ජීවතුන් අතර නොමැති නම් ඔවුන් සඳහා මරණ සහතික ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.(පා.6/’15)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ පිහිටි හමුදා කඳවුරු වෙනත් ස්ථානවල පිහිටුවීම :** ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා, ගරු අලි සහීර් මවුලානා සෙය්යිඩ් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— ත්‍රිකුණාමල නාවික කඳවුර, උතුරු සහ නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය සඳහා වූ ප්‍රධාන හමුදා කඳවුර වුවද, යුද්ධය අවසන් වූ පසු පුල්මුඩේ සිට ලංකා පටුන දක්වා වූ ප්‍රදේශයේ කුඩා නාවික හමුදා සහ යුද හමුදා කඳවුරු ගණනාවක් පිහිටුවා ඇති අතර මේවා ව්‍යවසායකත්වයට, ධීවරයින්ගේ සහ සාමාන්‍ය ජනතාවගේ ක්‍රියාකාරකම් වලට බාධකයක් බවට පත්වී ඇති බැවින් හමුදා කඳවුරු සාමාන්‍ය ජන ජීවිතයට උපකාර කිරීම පිණිස වෙනත් ස්ථානවල පිහිටුවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.(පා.141/’15)

“ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය යුතුය”යි අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ. භා. 3.50 ට ගරු ජේ. එම්. ආනන්ද කුමාරසිරි මහතා මූලාසනාරූඪ විය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. රට තුළ ඇති යුදමය නටබුන් ප්‍රතිසංස්කරණය කර ජනතා යහපත පිණිස යොදාගැනීම :** ගරු ඩග්ලස් දේවානන්ද මහතා, ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— රටේ පැවති යුදමය වාතාවරණය හේතුවෙන් ද, යුදමය ක්‍රියාන්විතයන් හේතුවෙන් ද, විශේෂයෙන් උතුරු හා නැගෙනහිර පළාත් ඇතුළු රටේ සියලුම ප්‍රදේශවල විනාශව තිබෙන්නා වූ ගොඩනැගිලි, ජල ටැංකි, දුම්රිය, බස්රථ හා ගුවන් යානා ආදිය ප්‍රදර්ශන ස්ථාන ලෙස ද, ආරක්ෂක ස්ථාන ලෙස ද, රජයේ වියදමින් නොකඩවා නඩත්තු කර පවත්වාගෙන යෑම ජාතීන්

අතර සංහිඳියාව ගොඩනංවා ගැනීමට බාධාවක් වී ඇති බැවින්, රටේ වත්මන් තරුණ පරම්පරාව සහ අනාගත පරම්පරාව අතරින් රටේ සිදුවූ යුදමය විනාශයන් සම්බන්ධ මතකයන් තුරන් කිරීමේ අරමුණින් යුතුව මෙලෙස විනාශයට පත්වූ ස්ථාන හා අනෙකුත් දේපළ නැවත ප්‍රතිසංස්කරණය කර මහජන යහපත උදෙසා ඒවා භාවිතා කිරීමට රජය නිර්මාණාත්මක පියවරක් ගත යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.(පා.146/’15)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. රජයේ සේවකයින්ගේ මූලික වැටුපෙන් ගණනය කරන 40% අවකරණ සීමාව දීමනා සහිත දළ වැටුපට ගණනය කිරීම :** ගරු ප්‍රසන්න රණවීර මහතා, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා ස්ථිර කරමින් ඉදිරිපත් කළ යෝජනාව,— රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය අනුව ණය ලබා ගැනීමේ දී 40% අවකරණ සීමාව ගණනය කරනුයේ මූලික වැටුප මත පදනම්ව වන බැවින්, රාජ්‍ය සේවකයින්ට හදිසි අවශ්‍යතාවකට හෝ නිවාස අලුත්වැඩියාවකට රාජ්‍ය බැංකුවකින් හෝ රාජ්‍ය අනුබද්ධ ආයතනයකින් ණය මුදලක් ලබා ගැනීමට මෙම යල්පැන ගිය නීතිය බාධාවක් වන අතර, හත් වසරක දේපළ ණය ලබා ගැනීමේ දී, පස් වසරක ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවා කාලයක් ද සලකා බලන හෙයින්, මෙම අවකරණ සීමාව අදාළ නොවුණ ද, රජයේ සේවයට අලුතින් බැඳෙන රාජ්‍ය සේවකයෙකුට ඉහත අවකරණ සීමාව හේතුවෙන් ණය මුදලක් ලබා ගැනීම දුෂ්කර වන බැවින් 40% අවකරණ සීමාව දීමනා සහිත දළ වැටුප මත ගණනය කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.(පා.148/’15)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. කල් තැබීම (ගුරු උපදේශක සේවය ස්ථාපනය කිරීම) :** “මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය”යි අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා යෝජනා කළේය.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය; අ. භා. 6.45 ට 2016 පෙබරවාරි මස 23 වැනි අඟහරුවාදා අ. භා. 1.00 වනතෙක් පාර්ලිමේන්තුව කල් ගියේය.